ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව
ප්‍රධාන කාර්යාලය - කොළඹ
මාතලේ, මහනුවර, හල්දුම්මුල්ල සහ ගාල්ල පිහිටි වතු සඳහා

සැපයුම්කරුවන් සහ ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම - 2027

2027 වර්ෂය සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සමග ලියාපදිංචි වීමට කැමති පිළිගත් දේශීය සැපයුම්කරුවන්, සේවා සපයන්නන් සහ ගැනුම්කරුවන් වෙතින්, සංස්ථාවේ ප්‍රධාන කාර්යාලය හා මාතලේ, මහනුවර, හල්දුම්මුල්ල සහ ගාල්ල ප්‍රදේශවල පිහිටි වතු හා ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ, සේවා සහ නිෂ්පාදන සැපයීම/ මිලදී ගැනීම සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

A. භාණ්ඩ හා උපකරණ	
අංකය	**වර්ගීකරණය**
01	කාර්යාලීය ලිපි ද්‍රව්‍ය, A4 කඩදාසි, කැල්කියුලේටර්, කාබන් කොළ සහ අනෙකුත් කාර්යාලීය පරිභෝජන ද්‍රව්‍ය
02	කාර්යාලීය ගෘහ භාණ්ඩ – යකඩ, ඇලුමිනියම් සහ ලී ගෘහ භාණ්ඩ
03	පරිගණක, ලැප්ටොප්, මුද්‍රණ හා ඡායාපිටපත් යන්ත්‍ර, ටෝනර්, දුරකථන, ERP හා අනෙකුත් මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණ
04	කාර්යාලීය විදුලි හා ඉලෙක්ට්‍රොනික උපකරණ, විදුලි පංකා, CCTV පද්ධති, වායු සම්කරණ යන්ත්‍ර හා අමතර කොටස්, මහජන ඇමතුම් පද්ධති සහ අනෙකුත් විදුලි උපකරණ
05	වාහන බැටරි, ටයර්, ටියුබ් සහ වාහන අමතර කොටස්
06	රසායනික ද්‍රව්‍ය, පොහොර සහ වල්නාශක – අදාළ නීති හා රෙගුලාසි අනුව පොහොර ලේකම් කාර්යාලයේ/ අදාළ ආයතනයේ ලියාපදිංචිය අනිවාර්ය වේ
07	තේ ඇසුරුම් ද්‍රව්‍ය – කන්ටේනර් සැක්ස්, කඩදාසි බෑග්, මෙටලයිස් බෑග්, සෙලෝෆේන්, ඇලුමිනියම් ෆොයිල් බෑග්, නයිලෝන් බෑග් සහ අනෙකුත් ඇසුරුම් ද්‍රව්‍ය
08	මුද්‍රණ ද්‍රව්‍ය හා මුද්‍රණ සේවා – සංස්ථාවේ තේ ඇසුරුම් සඳහා භාවිත කරන බෑග්, වාර්ෂික වාර්තා, බිල්පත් පොත්, ඇණවුම් පොත්, ටිකට් පොත්, චෙක් රෝල්, ෆීල්ඩ් ෂීට්, මාස්ටර් ෂීට් සහ අනෙකුත් මුද්‍රිත ද්‍රව්‍ය
09	තේ කර්මාන්තශාලා හා අනෙකුත් කර්මාන්තශාලා සඳහා යන්ත්‍ර සූත්‍ර, උපකරණ හා අමතර කොටස්
10	කෘෂිකාර්මික උපකරණ – අත් උපකරණ, කප්පාදු හා ශාක තඩන්තු උපකරණ, වගා හා පස සකස් කිරීමේ උපකරණ, කෘෂි ඉසින උපකරණ සහ අස්වනු නෙළීමේ උපකරණ
11	තේ පැළ, කෝපි පැළ, පුවක් පැළ, සේර පැළ සහ අනෙකුත් අදාළ පැළෑටි
12	තේ කර්මාන්තශාලා සඳහා දර – ගෝමර සහ කැලෑබොක්ක තේ කර්මාන්තශාලා සඳහා

B. සේවා සැපයීම	
අංකය	**වර්ගීකරණය**
13	සංස්ථාවේ තේ ඇසුරුම් සේවා – 50g, 100g සහ Tea Bag ඇසුරුම් කිරීම
14	වායු සම්කරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරීම, තඩන්තු කිරීම සහ අමතර කොටස් සැපයීම
15	තොරතුරු තාක්ෂණ සේවා – CCTV, පරිගණක, ජාලගත කිරීම, පරිගණක තඩත්තුව, මුද්‍රණ හා ඡායාපිටපත් සේවා
16	වාහන අලුත්වැඩියා කිරීම, ටින්කරින් හා පින්තාරු කිරීම, වාහන ආසන/කුෂන් කිරීම සහ සවිකිරීම් සේවා
17	පිරිසිදු කිරීමේ සේවා
18	තේ සැපයුම් හා ආශ්‍රිත සේවා
19	ප්‍රවාහන සේවා
20	දේශීය කුරියර් සේවා
21	පානීය ජල සැපයුම් සේවා
22	රක්ෂණ සේවා
23	කාර්යාලීය අභ්‍යන්තර නිම කිරීමේ සේවා – Interior Work, Partition, Sand Blasting, File Racks, Carpeting, Wiring ආදිය. අදාළ කාර්යයන් සඳහා CIDA ලියාපදිංචිය/ ශ්‍රේණිගත කිරීම අදාළ වන අවස්ථාවල අනිවාර්ය වේ.
24	මැනුම් හා තලමිතික කටයුතු
25	කෘමි මර්දන සේවා – මදුරුවන්, මීයන්, වේයන් සහ අනෙකුත් පළිබෝධකයන්
26	විදුලි කාර්මික, ජල නල කටයුතු සේවා
27	රාජකාරී නිල ඇඳුම්, ආරක්ෂිත ඇඳුම් සහ ටී-ෂර්ට් සැපයීම
28	මේසන් වැඩ, ගොඩනැගිලි තඩන්තු හා තීන්ත ආලේප කිරීමේ කටයුතු – මහනුවර ප්‍රදේශයේ වතු සඳහා
29	තේ කර්මාන්තශාලා යන්ත්‍ර සූත්‍ර අලුත්වැඩියා කිරීම, තඩන්තු කිරීම සහ තාක්ෂණික සේවා

C. ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම	
අංකය	**වර්ගීකරණය**
30	දූව – ගාන්දිස්, යුකලිප්ටස්, රෙඩ්ගම් සහ අනෙකුත් දූව වර්ග
31	අඛලි ද්‍රව්‍ය – මෝටර් රථ අඛලි කොටස්, තේ කර්මාන්තශාලා අඛලි ද්‍රව්‍ය සහ අනෙකුත් අඛලි ද්‍රව්‍ය
32	සුළු අපනයන බෝග – කුරුඳු, එනසාල්, කෝපි සහ අනෙකුත් බෝග
33	කසල තේ
34	අමු තේ දළු
35	රබර් කිරි

අයදුම් කිරීමේ ක්‍රමය :-

1. 2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා ගැනුම්කරුවන් ලෙස ලියාපදිංචි වීමට අපේක්ෂා කරන ආයතන හා පුද්ගලයින් විසින් අදාළ එක් එක් වර්ගීකරණ අයිතමය සඳහා වෙන වෙනම අයදුම්පතක් ඉදිරිපත් කළ යුතුය.
2. ලියාපදිංචි අයදුම්පත සතියේ වැඩ කරන දිනවල **පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා, රු. 1,000.00ක** ආපසු නොගෙවන අයදුම්පත් ගාස්තුවක් ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ මුදල් අයකැමි වෙත ගෙවා අදාළ රිසිටිපත ඉදිරිපත් කිරීමෙන් ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයෙන් ලබාගත හැකි අතර, අයදුම්පත **slspc.lk** නිල වෙබ් අඩවියෙන් බාගත කරගත්තේ නම්, අදාළ ගාස්තුව **"ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව"** නමින් මහජන බැංකුවේ 1st City Branch පවත්වාගෙන යනු ලබන **ගිණුම් අංක 046100240000933 වෙත** බැර කර, බැංකු තැන්පතු පත්‍රිකාවේ **"සැපයුම්කරුවන් සහ ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2027"** යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතුය.
3. සම්පූර්ණ කරන ලද අයදුම්පත සමග පහත සඳහන් ලේඛන ඉදිරිපත් කළ යුතුය :
   - ව්‍යාපාර ලියාපදිංචි සහතිකය / සමාගම් ලියාපදිංචි ලේඛන;
   - අදාළ ව්‍යාපාර ක්ෂේත්‍රයට අදාළ බලපත්‍ර, සහතික හෝ ලියාපදිංචි සහතික;
   - VAT ලියාපදිංචියට අදාළ තොරතුරු;
   - අදාළ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා පවතින තාක්ෂණික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ තොරතුරු;
   - පෙර භාණ්ඩ හෝ සේවා සපයා ඇති රාජ්‍ය හෝ පෞද්ගලික ආයතන පිළිබඳ තොරතුරු සහ අවශ්‍ය අවස්ථාවලදී, අදාළ සේවා අත්දැකීම් තහවුරු කරන ලේඛන;
   - අදාළ වර්ගීකරණයට විශේෂයෙන් අවශ්‍ය වන අනෙකුත් බලපත්‍ර හෝ ලියාපදිංචි සහතික.
4. සම්පූර්ණ කරන ලද අයදුම්පත, අදාළ ලේඛන සහ ගාස්තු ගෙවීමේ රිසිටිපත සමග ලියුම් කවරයක බහා, ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ **"සැපයුම්කරුවන් සහ ගැනුම්කරුවන් ලියාපදිංචි කිරීම – 2027"** යනුවෙන් පැහැදිලිව සඳහන් කර, ලියාපදිංචි තැපැලෙන් හෝ කුරියර් සේවය මගින් **සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 257, සිරිධම්ම මාවත, කොළඹ 10.** යොමු කළ හැකි අතර, අයදුම්කරුවන්ට ප්‍රධාන කාර්යාලයේ ප්‍රසම්පාදන අංශයට පැමිණ සෘජුවම අයදුම්පත් භාරදීමටද හැකිය.
5. අසම්පූර්ණ අයදුම්පත්, අවශ්‍ය ලේඛන ඉදිරිපත් නොකරන අයදුම්පත් හෝ අදාළ වර්ගීකරණයට අවශ්‍ය නීත්‍යානුකූල ලියාපදිංචි කිරීම් හා බලපත්‍ර නොමැති අයදුම්කරුවන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවට අයිතිය ඇත.

2027 වර්ෂය සඳහා සැපයුම්කරුවන් හා ගැනුම්කරුවන් ලෙස ලියාපදිංචි වීම සඳහා අයදුම්පත් භාරගැනීම 2026.09.24 දින සිට 2026.12.01 දින දක්වා සිදු කෙරේ.

සභාපති,
ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව,
අංක 257, සිරිධම්ම මාවත,
කොළඹ 10.
විමසීම් සඳහා :
ප්‍රසම්පාදන අංශය – 011-4194879
ඊමේල් – slspcpro@gmail.com